# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/45 - 2019 ජනවාරි මස 25 වැනි සිකුරාදා - 2019.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වන වගන්තියේ (3) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2019 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දීය.

නියෝග

මෙම නියෝග 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2019 ජනවාරි 28 දින සිට ක්‍රියාත්මක වේ.

2018 ජූලි මස 13 වන දිනැති අංක 2079/70 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* සහ 2018 අගෝස්තු මස 10 වන දිනැති අංක 2083/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියෝග මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

**අ. වාහන වායු විමෝචන ප්‍රමිති**

2. (අ) 1 වන උප ලේඛනයේ III වන තීරුවේ සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කරන ලද ශ්‍රී ලංකාවට ආනයන කරනු ලබන සියලුම මෝටර් වාහන 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද අංක 2079/42 සහ 2018 ජූලි මස 12 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* තුන්වන උපලේඛනයෙහි හෝ අංක 2083/3 සහ 2018 අගෝස්තු මස 06 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පස්වන උපලේඛනයෙහි සඳහන් වාහන වායු විමෝචන ප්‍රමිතිවලට හා කලින් කලට කරනු ලබන සංශෝධනවලට අනුකූල විය යුතුය.

(ආ) කෙසේ වුවද, සියලුම විදුලි වාහන වායු විමෝචන සීමාවලට අනුකූලවීම අවශ්‍ය නොවනු ඇත.

*1 වන උප ලේඛනය : වාහන වායු විමෝචන ප්‍රමිති*

| I | II | III |
|---|---|---|
| *අංක* | *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *විමෝචන ප්‍රමිතිවලට යටත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක* |
| 01 | 87.01 | 8701.20.10, 8701.20.20 |
| 02 | 87.03 | පහත දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හැර සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.03 යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8703.10.19, 8703.10.29, 8703.21.62, 8703.40.21, 8703.40.22, 8703.50.21, 8703.50.22, 8703.60.21, 8703.60.22, 8703.70.21, 8703.70.22, 8703.21.64, 8703.21.73, 8703.40.25, 8703.40.26, 8703.50.25, 8703.50.26, 8703.60.25, 8703.60.26, 8703.70.25, 8703.70.26 |
| 03 | 87.02,87.04,87.05,87.11 | සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.02,87.04,87.05,87.11යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක |

**ආ. ආරක්ෂණ මිනුම් / ප්‍රමිති**

3. (අ) II වන උප ලේඛනයේ IV වන තීරුවෙහි දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කර ඇති ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලුම මෝටර් වාහන II වන උප ලේඛනයේ III වන තීරුවෙහි දක්වා ඇති ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූල විය යුතුය.

(ආ) II වන උප ලේඛනයේ IV වන තීරුවෙහි 2 (ii) හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කරන ලද, 2020 ජූනි 30 දින හෝ එදිනට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කර 2020 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් මුදා හරින ලද මගී ප්‍රවාහන වාහන සඳහා ප්‍රති අගුළු තිරිංග පද්ධති තාක්ෂණය (ABS Technology) අදාළ නොවේ.

කෙසේ වුවද, එම වර්ගීකරණය යටතේම, 2020 ජූනි 30 දින හෝ එදිනට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කර 2020 දෙසැම්බර් 31 දිනට පසු ශ්‍රී ලංකා රේගුවෙන් මුදා හරින හෝ 2020 ජූනි 30 දිනට පසු විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කරන ඕනෑම වාහනයක් ප්‍රති අගුළු තිරිංග පද්ධති තාක්ෂණය (ABS Technology) මෙන්ම ආසන පටි පැවතීමේ අවශ්‍යතාවටද අනුකූල විය යුතුය.

(ඉ) II වන උප ලේඛනයේ IV වන තීරුවෙහි 3 (iii) හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කරන ලද, 2019 සැප්තැම්බර් 01 දින හෝ එදිනට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කර 2019 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් මුදා හරින භාණ්ඩ ප්‍රවාහන වාහන සඳහා ප්‍රති අගුළු තිරිංග පද්ධති තාක්ෂණය (ABS Technology) අදාළ නොවේ.

කෙසේ වුවද, එම වර්ගීකරණය යටතේම, 2019 සැප්තැම්බර් 01 දින හෝ එදිනට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කර 2019 දෙසැම්බර් 31 දිනට පසු ශ්‍රී ලංකා රේගුවෙන් මුදා හරින හෝ 2019 සැප්තැම්බර් 01 දිනට පසු විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කරන ඕනෑම වාහනයක් ප්‍රති අගුළු තිරිංග පද්ධති තාක්ෂණය (ABS Technology) මෙන්ම ආසන පටි පැවතීමේ අවශ්‍යතාවටද අනුකූල විය යුතුය.

***II* වන උප ලේඛනය : ආරක්ෂණ මිනුම් / ප්‍රමිති**

| I | II | III | | | IV |
|---|---|---|---|---|---|
| *අංකය* | *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *ආරක්ෂණ මිනුම් / ප්‍රමිති* | | | *ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට යටත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක* |
| | | *වායු බැලුන* | *ආසන පටි* | *ප්‍රති අගුළු තිරිංග පද්ධතිය* | |
| 01 | 87.02 | C | C | C | 8702.10.12, 8702.10.13, 8702.10.19, 8702.10.21, 8702.10.29, 8702.10.32, 8702.10.33, 8702.10.39, 8702.10.41, 8702.10.49<br><br>8702.20.11, 8702.20.12, 8702.20.19, 8702.20.21, 8702.20.29, 8702.20.31, 8702.20.32, 8702.20.39, 8702.20.41, 8702.20.49<br><br>8702.30.11, 8702.30.12, 8702.30.19, 8702.30.21, 8702.30.29, 8702.30.31, 8702.30.32, 8702.30.39, 8702.30.41, 8702.30.49<br><br>8702.40.11, 8702.40.12, 8702.40.19, 8702.40.21, 8702.40.29, 8702.40.31, 8702.40.32, 8702.40.39, 8702.40.41, 8702.40.49<br><br>8702.90.12, 8702.90.13, 8702.90.19, 8702.90.21, 8702.90.29, 8702.90.32, 8702.90.33, 8702.90.39, 8702.90.41, 8702.90.49 |
| 02 (i) | 87.03 | C | C | C | පහත දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ 2(ii ) හි IV වන තීරුවේ දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හැර සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.03 යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක<br><br>8703.10.11, 8703.10.19, 8703.10.21, 8703.10.29<br><br>8703.21.30, 8703.21.40, 8703.21.51, 8703.21.52, 8703.21.53, 8703.21.54, 8703.21.55, 8703.21.62, 8703.21.64, 8703.21.73<br><br>8703.22.30, 8703.22.40, 8703.23.30, 8703.23.40, 8703.24.30, 8703.24.40<br>8703.31.30, 8703.31.40, 8703.31.50, 8703.31.60, 8703.32.30, 8703.32.40<br>8703.33.30, 8703.33.40<br><br>8703.40.13, 8703.40.14, 8703.40.15, 8703.40.16, 8703.40.21, 8703.40.22, 8703.40.25, 8703.40.26, 8703.40.33, 8703.40.34, 8703.40.43, 8703.40.44, 8703.40.63, 8703.40.64, 8703.40.83, 8703.40.84<br><br>8703.50.13, 8703.50.14, 8703.50.15, 8703.50.16, 8703.50.21, 8703.50.22, 8703.50.25, 8703.50.26, 8703.50.33, 8703.50.34, 8703.50.43, 8703.50.44, 8703.50.63, 8703.50.64, 8703.50.83, 8703.50.84<br><br>8703.60.13, 8703.60.14, 8703.60.15, 8703.60.16, 8703.60.21, 8703.60.22, 8703.60.25, 8703.60.26, 8703.60.33, 8703.60.34, 8703.60.43, 8703.60.44, 8703.60.63, 8703.60.64, 8703.60.83, 8703.60.84<br><br>8703.70.13, 8703.70.14, 8703.70.15, 8703.70.16, 8703.70.21, 8703.70.22, 8703.70.25, 8703.70.26, 8703.70.33, 8703.70.34, 8703.70.43, 8703.70.44, 8703.70.63, 8703.70.64, 8703.70.83, 8703.70.84<br><br>8703.80.11, 8703.80.12 |

***II* වන උප ලේඛනය : ආරක්ෂණ මිනුම් / ප්‍රමිති (සම්බන්ධිතයි)**

| I | II | III | | | IV |
|---|---|---|---|---|---|
| අංකය | සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | ආරක්ෂණ මිනුම් / ප්‍රමිති | | | ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට යටත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක |
| | | වායු බැලුන | ආසන පටි | ප්‍රති අගුළු තිරිංග පද්ධතිය | |
| 02 (ii) | | - | C | * | 8703.21.63, 8703.21.72, 8703.40.23, 8703.40.24, 8703.50.23, 8703.50.24, 8703.60.23, 8703.60.24, 8703.70.23, 8703.70.24, 8703.80 (විදුලි කොඩ්රිසයිකල්)<br>* ප්‍රති අගුළු තිරිංග පද්ධති (ABS) සඳහා 3(ආ) රෙගුලාසි බලන්න. |
| 03 (i) | 87.04 | C | C | C | 8704.21.71, 8704.21.72, 8704.21.91, 8704.21.92, 8704.21.93, 8704.21.99 8704.31.71, 8704.31.72, 8704.31.91, 8704.31.92, 8704.31.93, 8704.31.99 |
| 03 (ii) | | - | C | C | පහත දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ 3(i), 3(iii) හි IV වන තීරුවේ දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හැර සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.04 යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක<br>8704.21.21, 8704.21.22,8704.31.21, 8704.31.22, 8704.31.23,8704.90.10, 8704.90.20 |
| 03 (iii) | | - | C | * | 8704.21.41, 8704.21.42, 8704.21.43, 8704.21.44, 8704.21.61, 8704.21.62, 8704.21.63, 8704.21.64, 8704.21.65, 8704.21.66, 8704.21.67, 8704.21.68<br>8704.31.41, 8704.31.42, 8704.31.43, 8704.31.44, 8704.31.61, 8704.31.62, 8704.31.63, 8704.31.64, 8704.31.65, 8704.31.66, 8704.31.67, 8704.31.68<br>* ප්‍රති අගුළු තිරිංග පද්ධති (ABS) සඳහා 3(ඉ) රෙගුලාසි බලන්න |
| 04 | 87.05 | - | C | C | සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ87.05යටතේ වර්ගීකරණය කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක |

(C - සියලුම ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූල වියයුතු)

4. මෙම නියෝග අනුව,

(අ) සංයෝජිත වර්ගීකරණ පරිච්ඡේද 87 යටතේ වර්ගීකරණය කරන ලද පාවිච්චි නොකරන ලද මෝටර් රථ ආනයනය කිරීමේදී එම මෝටර් රථ ඉහත සඳහන් කරන ලද වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූල වන බවට නිෂ්පාදක විසින් නිකුත් කරන ලද නිෂ්පාදක සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) ඉහත (අ) තුළ සඳහන් කරන ලද පාවිච්චි නොකරනලද මෝටර් රථ හැරුණු විට, අනෙකුත් සියලුම මෝටර් රථ ආනයනයේදී හෝ සැපයුම්කරුවෙකු විසින් අලුත් වාහනයක් ආනයනය කිරීම සඳහා නිෂ්පාදක සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී, එම මෝටර් රථ ඉහත සඳහන් කරන ලද වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූල වන බවට, කලින් කලට සංශෝධනය කරනු ලබන පරිදි අංක 1804/17 සහ 2013 අප්‍රේල් 03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද බලය ලත් පරීක්ෂණ නියෝජිතායන විසින් නිකුත් කරන ලද පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) නිෂ්පාදක හෝ බලය ලත් පරීක්ෂණ නියෝජිතායතන විසින් නිකුත් කරන ලද සහතිකයක මෙම නියමයන්ගේ අරමුණට පටහැනි වන ආකාරයේ ව්‍යාජ තොරතුරු ඇතුළත් වන බවට හඳුනා ගතහොත් එකී පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට පාලක ජනරාල් සලකා බලනු ඇත.

(ඊ) ආනයනකරු විසින් මෙම නියමයන්ගේ අරමුණට පටහැනි වන ආකාරයෙන් ව්‍යාජ සහතික ඉදිරිපත් කර ඇත්නම් එකී පාර්ශ්වයට එරෙහිව නීතිමය පියවර ගැනීමට පාලක ජනරාල් සලකා බලනු ඇත.

5. ප්‍රතිලාභියා ගේ/ගනු දෙනු කරන බැංකුව මඟින් නිෂ්පාදක සහතිකය සහ පූර්ව නැව්ගත කිරීම් පරීක්ෂණ සහතිකය වලංගු ණයවර ලිපි විවෘත කරන ලද මෙරට බැංකුව වෙත සෘජුව එවිය යුතුය.

6. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රමයේ 87 වන පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කරන ලද මෝටර් වාහන ආනයනය එකී මෝටර් වාහන නැව්ගත කිරීමට පෙර විවෘත කරන ලද ණයවර ලිපි මගින් පමණක් සිදුකළ යුතුය. මෙම නියමයන්හි සඳහන් වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් / ප්‍රමිති එකී මෝටර් වාහන ආනයනයේදී පැවතිය යුතු අනිවාර්ය අවශ්‍යතා වශයෙන් ණයවර ලිපිවල ඇතුළත් විය යුතුය.

7. එකී වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූලනොවන මෝටර් වාහන ආනයනකරු විසින් තම වියදමින් ප්‍රති අපනයනය කළ යුතුය.

8. 1956 නොවැම්බර් 30 දිනට පෙර නිෂ්පාදනය කරන ලද පැරණි වාහන වායු විමෝචන සීමා සහ ආරක්ෂණ මිනුම් / ප්‍රමිතිවලට අනුකූලවීම අවශ්‍ය නොවේ.

9. කිසියම් පුද්ගලයෙකු හෝ භාණ්ඩ තොගයක් සඳහා මෙම නියම අදාළ කර ගැනීමේදී යම් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් ස්වකීය අභිමතය පරිදි ඒ පිළිබඳ අවසන් තීරණය ගනු ඇත.

*සටහන් :*

| | | | |
|---|---|---|---|
| 1. | ආසන පටි | - | ආසන පටි සම්බන්ධයෙන්, රියදුරු සහ ඉදිරි අසුනෙහි සිටින්නා සඳහා උරහිස් හා උකුල් ආසන පටිද (Three-point seat belts) පැවතිය යුතු අතර අනෙකුත් මගීන් සඳහා අවශ්‍ය පරිදි අවම වශයෙන් උකුල් ආසන පටි ද (Two-point seat belts) පැවතිය යුතුය. |
| 2. | වායු බැලුන | - | රියදුරු සහ ඉදිරි අසුනෙහි සිටින්නා සඳහා ප්‍රමිතිගත වායු බැලුන තිබිය යුතුය |
| 3. | ප්‍රති අගුළු තිරිංග පද්ධතිය (ABS) | - | සියලු වාහන නිෂ්පාදනයේ දී ප්‍රති අගුළු තිරිංග පද්ධතිය (Anti-Locking Breaking System) තිබිය යුතුය |

02 - 399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.